# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/45 – 2019 මාර්තු 01 වැනි සිකුරාදා – 2019.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය වන බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දඹදෙණි, උඩුකහ නැගෙනහිර කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 976, බටහිර වෙන්නොරුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෙන්නොරුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේයූ/ඒඑල්ඩබ්ලිව්/2015/212 හා 2015.12.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – වෙන්නොරුව මුතුගල වත්ත – ප්‍රමාණය: **හෙක්. 1.2463 ක් පමණ**

උතුරට: මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය; නැගෙනහිරට: මාර්ගය; දකුණට: මාර්ගය, ඊ. පී. ඩී. රණසිංහ සහ තවත් අය හිමිකම් කියන වෙන්නොරුව වත්ත; බටහිරට: එම්. එස්. විජේතිලක සහ තවත් අය හිමිකම් කියන විල්ගමුව වත්ත සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/2/2014/ඒ/186.
2019 ජනවාරි මස 03 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 864